කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය - 2019

-----------------------------------------------------------------------

කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3716 - එස්ආර්අයි දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තාකල යුතු යැයි සැලකෙන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මාර්ග හා මහා මාර්ග අමාත්‍යාංශය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ආර්ථික ක්‍රියාකාරකම් සඳහා ධනාත්මක බලපෑමක් ඇති කිරීම සහ කොළඹ නගරයේ රථවාහන තදබදය අවම කිරීම සඳහා අපේක්ෂා කරන කලාපීය ප්‍රතිලාභ ලබා දීම , කොළඹ සිට කටුනායක ගුවන්තොටුපල දක්වා ගමන් කාලය අඩුකිරීම සහ වරායේ සිට කොළඹ වෙනත් ප්‍රදේශයන්ට භාණ්ඩ ප්‍රවාහනයේදී ඇතිවන රථවාහන තදබදයට සහන සැලසීම ව්‍යාපෘතියේ අරමුණු වේ. කොළඹ මාර්ගවල බහාලුම් ගෙනයාමේදී අපේක්ෂාකරන අඩුවීම නිසා, කොළඹ තදාසන්න ප්‍රදේශවල රථවාහන තදබදයද ලිහිල්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2016 පෙබරවාරි 16 දිනැති කැබිනට් සංදේශයට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 360.2 ක් වේ. ව්‍යාපෘතියේ කටයුතු 2016 පෙබරවාරි මස ආරම්භ කරන ලද අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2016 මාර්තු මාසයේදී ලැබී තිබුණි. ව්‍යාපෘතිය 2025 වර්ෂයේදී නිම කිරීමට නියමිතය.

## 1.3 මතය

---------

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | ගිණුම්කරණ අඩුපාඩුව | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේනිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය වෙනත් ව්‍යාපෘති 03ක් සමග එකම ගොඩනැගිල්ලක මෙහෙයුම් සිදුකර තිබුණි. කෙසේ වුවද විදුලිය, දුරකථන, ජලය, ගොඩනැගිලි කුලී, පිරිසිදු කිරීම් සේවා සහ ආරක්ෂක වියදම් යනාදි පොදු කාර්ය වියදම් ව්‍යාපෘති ගිණුමට අන්තර්ග්‍රහනය කර නොතිබුණි. ඒ හේතුවෙන් වෙන්කිරීම් නොකරන ලද පොදුකාර්යය පිරිවැය වටිනාකමින් ව්‍යාපෘතියේ මුළු පිරිවැය අඩුවෙන් දක්වා තිබුණි. | ව්‍යාපෘතියේ මුළු පිරිවැය වෙන්කිරීම් නොකරන ලද ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වීම. | ව්‍යාපෘති අතර සාමාන්‍ය වියදම් වෙන් කිරීම, නිවැරදි ක්‍රමය වුවද, එය ප්‍රායෝගිකව අනුගමනය කිරීමේදී අප දුෂ්කරතාවයන්ට මුහුණ දේ. | ව්‍යාපෘති අතර පොදු කාර්යය පිරිවැය වෙන් කිරීමට නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |
| (ආ) | බැඳීම් ගාස්තු හා පොලී ගාස්තු එකතුව රු.මිලියන 58.49ක් 2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව හෙළිදරව් කිරීමකින් තොරව ගිණුම් ගතකර තිබුණි. | වටිනාකමේ නිවැරදිතාවය තහවුරුකර ගැනීමට නොහැකිවීම. | අදහස් දක්වා නැත. | බැඳීම් හා පොලී ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම හෙළිදරව් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. |

**3.** භෞතික කාර්ය සාධනය

**3.1** වියාපෘති කටයුතු ආරම්භ කිරීම / ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීම්

| අංකය | ක්‍රියාකාරකම් | ආරම්භ කිරීමට නියමිත දිනය | ආරම්භ කළ දිනය | ප්‍රමාදය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|
| (අ) | කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය ඉදිකිරීම | 2018 දෙසැම්බර් | 2019 සැප්තැම්බර් 27 | මාස 08 | ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාදවීම සහ කොන්ත්‍රාත්තු වේ පිරිවැය ඉක්මවා යා හැකිය | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම. ප්‍රමාදවීම පිළිගනිමි. | ව්‍යාපෘතියේ කටයුතු වේගවත්ව කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | වරාය පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයක් ඉදිකරීම. | 2019 ඔක්තෝබර් | මේ දක්වා ආරම්භ කර නැත | මාස 03 | - එම - | - එම - | - එම - |
| (ඇ) | වරාය පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයේ ටැඹ ඉදිකිරීම් (Pilling Work) | 2018 දෙසැම්බර් | 2019 ජුනි | මාස 07 | - එම - | - එම - | - එම - |
| (ඈ) | විදුහුත් ගාස්තු අයකිරීම් පද්ධතිය සඳහා කොන්ත්‍රාත්කරුවකු බඳවා ගැනීමට ආදාල ප්‍රසම්පාදනය | 2019 ජුනි | මේ දක්වා ප්‍රදානය කර නොමැත | මාස 07 | - එම - | - එම - | - එම - |

කොන්ක්‍රීට් කණු මත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතියේ 2019 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම අනුව විස්තර

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ සිදුකරනු ලැබේ.

| **අංකය**<br>------ | **විගණන නිරීක්ෂණය**<br>--------------------- | **බලපෑම**<br>----------- | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**<br>-------------------- | **විගණකගේ නිර්දේශය**<br>-------------- |
|---|---|---|---|---|
| (අ) | කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2016 මාර්තු මාසයේදී කැබිනට් අනුමැතිය ලැබී තිබූ අතර ණය ගිවිසුම 2019 ජනවාරි අත්සන්කර තිබුණි. කෙසේ වුවද, 2019 ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබූ වටිනාකම රු.මිලියන 37,360ක ක්‍රියාකාරකම් 13ක් ආරම්භ කිරීම 2019 වර්ෂය සඳහා වූ ප්‍රගති වාර්තාව අනුව ආසන්න වශයෙන් මාස 8ක් ප්‍රමාද වී තිබුණි.<br><br>ඒ අනුව, වරාය ප්‍රවේශ මාර්ගයේ ඉදිකිරීම් සහ කොන්ත්‍රාත් අධීක්ෂණය යන දෙකෙහි ප්‍රගතිය ඉලක්කය වූ සියයට 8ට සාපේක්ෂව සියයට 3ක් විය. ගොඩනැගිලි සැලසුම හා වරාය ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අධීක්ෂණය සහ වරාය පහසුකම් මධ්‍යස්ථානයේ ටැඹ (Pilling Work) ඉදි කිරීම්වල ඉලක්කය වූ සියයට 100 සාපේක්ෂව පිළිවෙලින් සියයට 70 සහ 84ක් විය. | කොන්ත්‍රාත් පිරිවැය ඉක්මවා යා හැකිය. | එකඟ වේ. වරාය ප්‍රවේශ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා මූලික අනුමැතිය 2016 මාර්තු මාසයේදී කැබිනට් මණ්ඩලයෙන් ලබා ගෙන තිබුණි. වරාය මෙහෙයුම් වලට කිසිදු බාධාවක් නොවන පරිදි කුළුණු ස්ථානගත කරන ස්ථාන තෝරා ගැනීමේදී බොහෝ අවිනිශ්චිතාවයක් පැවතුණි. තවද, බොහෝ උපයෝගී සේවා මෙම කොරිඩෝව යොදා ගනී. එනිසා කුළුණු ස්ථානගත කර කිරීම අවසන් කිරීම සඳහා සැලසුම්කල මාස 6ට සාපේක්ෂව මාස 13ක් වැඩිපුර ගත වී ඇත. | ව්‍යාපෘතිය විසින් ඉලක්ක දිනයට කාර්යයන් කඩිනමින් නිම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | වරාය පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයේ වැඹ (Piling Works) ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව රු. මිලියන 624කට ඉදිකිරීම් සමාගමට ප්‍රදානයකර තිබුණු අතර එය ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා වූ රු. මිලියන 126.5 ඉක්මවා තිබුණි. කෙසේ වුවද, රු. මිලියන 497.5ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තුව සියයට 25.43කින් ඉක්මවීමට හේතු විගණනයට හෙළිදරව් කර නොතිබුණි. | අතිරේක පිරිවැයක් දැරීමට සිදු වේ. | තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලියේදී අඩුවෙන්ම තක්සේරු කල ලංසුකරු සාර්ථක ලංසුකරු ලෙස තෝරා ගනී. සාර්ථක ලංසුකරුගේ ලංසුමිල ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 25කින් වැඩි විය. මෙය පිළිගතහැකි සංසන්දනාත්මක ක්‍රමයකින් ඇගයීමට ලක්කරන ලදී. අසාමාන්‍ය ඉහල රේටයන් හෝ වෙළඳපළ රේටයන්ට වඩා ඉහල රේටයන් නිශ්චය කිරීම සඳහා ඉදිකිරීම් ක්‍රියාකාරකම් අයිතමයන් ඉංජිනේරු ඇස්තමේන්තු රේටයන් හා අනෙකුත් ලංසුකරුවන්ගේ සාමාන්‍ය හා සසඳන ලදී. | විශාල වෙනස්කම් සඳහා බලපෑ හේතූන් විමර්ශනය කල යුතුය. |
| (ඇ) | විදේශ අරමුදල් ව්‍යාපෘති යටතේ වූ ගෙවීම් එකතුකල අගය මත බදුවලින් නිදහස්කර තිබුණද නියමිත කාලය තුලදී බදු නිදහස් කිරීම් ලබාගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය මගින් රු.මිලියන 332.48ක දේශීය බදු කොන්ත්‍රාත්කරුවන් හා උපදේශකවරුන් වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි. | අනවශ්‍ය ලෙස ව්‍යාපෘති පිරිවැය ඉහල යා හැකිය. | වැඩ පූර්ව අත්තිකාරම්වල පළමු වාරිකය එකතුකල අගයමත බදු නිදහස් කිරීම් ලබා ගැනීමට පෙර ගෙවා තිබුණි. ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 06 සිට එකතුකල අගය මත බදුවලින් නිදහස්ය. | දේශීය බදුවලින් නිදහස්වීම් ලබා ගැනීම සඳහා පූර්ව ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3** **ඌන උපයෝජිත සම්පත්.**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2019 වර්ෂයේදී අයවැය ප්‍රතිපාදන මගින් විදේශීය ණය හා ශ්‍රී ලංකා රජයේ වියදම් සඳහා පිළිවෙලින් රු.මිලියන 6500.8ක් සහ මිලියන 550ක් ලබා දී තිබුණි. කෙසේ වුවද, වෙන්කල ප්‍රතිපාදනයෙන් 2019 වර්ෂය අවසානයේදී විදේශ ණය රු.මිලියන 4406.25ක් හා ශ්‍රී ලංකා රජයේ අරමුදලින් රු. මිලියන 39.76ක් උපයෝජනයකර තිබුණි. ඒ අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් පිළිවෙලින් සියයට 32ක් හා සියයට 93ක් නියෝජනය කරන ණය ප්‍රතිපාදන රු. මිලියන 2094.55ක් සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන රු. මිලියන 510.24ක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි. | ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදයන් විය හැකිය. | වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතියේ සිවිල් වැඩ 2019 ජුනි සිට ආරම්භ කිරීමට සැලසුම් කල අතර උපදේශක හා කොන්ත්‍රාත්කරු සඳහා වැඩ පූර්ව අත්තිකාරම් ගෙවීමට ප්‍රමාණවත් අරමුදල් පවත්වාගැනීමට අදහස් කරන ලදී. තවද 2019 වර්ෂයේ ඊළග මාස 5 සඳහා මාසික කොන්ත්‍රාත්තු ගෙවීම් කිරීමටද අපේක්ෂා කරන ලදී. එබැවින් ලැබුණු රු. මිලියන 6500 ප්‍රමානවත් වේ. අනපේක්ෂිත ලෙස කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම ප්‍රමාද වූ අතර රු. මිලියන 2182ක් වැය නොවුණි. තවද, ශ්‍රී ලංකා රජයේ දායකයෙන් වෙන් කිරීම රු. මිලියන 550ක් වූ අතර රු. මිලියන 40ක අග්‍රිම පමනක් නිදහස් කරන ලදී. ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන යටතේ සිදුකලයුතු ගෙවීම්වල මිලියන 332.48ක් විය. | ක්‍රියාකාරී සැලැස්ම සැලකිලිලට ගෙන ඉලක්කගත ලගාකර යම් තීරනය කල යුතු අතර ඒ අනුව ප්‍රතිපාදන ඉල්ලීම් සිදුකල යුතුය. |

**3.4** **ව්‍යාපෘති අරමුණින් බැහැරව ගෙවීම් කර තිබීම.**

| **විගණන නිරීක්ෂණය** | **බලපෑම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|
| කණුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවය දේශීය පුවත්පත් 07ක ප්‍රචාරණය කිරීම වෙනුවෙන් ව්‍යාපෘතිය මගින් රු. මිලියන 2.17ක ප්‍රචාරණ වියදම් දරා තිබුණි. | ව්‍යාපෘතියේ පිරිවැය ඉහල යා හැකිය. | සමාරම්භක උත්සවය ගරු අග්‍රාමාත්‍ය තුමා හා මහා මාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා හා අනෙකුත් පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් 2019 සැප්තැම්බර් 10 දින පවත්වන ලදී. ප්‍රවෘත්ති පත්‍ර අතිරේක පළකිරීමට අදාල කාර්යයන් මෙයට ඇතුළත් විය. | ව්‍යාපෘතිය මගින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සඳහා අරමුදල් උපයෝජනය කිරීම අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.5** **මානව සම්පත් කළමනාකරණයට අදාල ගැටලු**

| **විගණන නිරීක්ෂණය** | **බලපෑම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|
| මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් කාර්ය මණ්ඩල තනතුරු 30ක් අනුමතකර තිබුණද නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂතනතුරු 01, ප්‍රධාන ඉංජිනේරු 02, ව්‍යාපෘති ඉංජිනේරු 05, ව්‍යාපෘති ගණකාධිකාරී හා ව්‍යාපෘති ලේකම් වරයෙකු ඇතුළු ප්‍රධාන තනතුරු 25ක් සමාලොචිත | අධිවේගී මාර්ගය සැලසුම් කිරීම් හා ඉදිකිරීම් ආරම්භ කිරීමට ප්‍රමාදයක් ඇති විය හැකිය. | උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිට අනුයුක්ත කාර්ය මණ්ඩලය කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය සඳහා යොදා ගන්නා ලදී. එමනිසා උතුරු මාර්ග සම්බන්ධතා | ව්‍යාපෘතියේ අවශ්‍යතාවයට අනුව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට පියවරගත යුතුය. |

වර්ෂය අවසන් වන විටත් පිරවීමට කටයුතුකර නොතිබුණි.

ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයෙකු ව්‍යාපෘති ඉංජිනේරුවරයෙකු හා ව්‍යාපෘති ලේකම් වරයා මෙම ව්‍යාපෘතියේ සේවයේ නිරත විය. උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතියේ ව්‍යාපෘති ගණකාධිකාරිවරයා කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතියට වැඩ බැලීමේ පදනම මත පත්කරන ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයෙකු හා ව්‍යාපෘති ඉංජිනේරුවරයෙකු දැනටමත් පත්කර ඇත. සෙසු කාර්ය මණ්ඩලය ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.